# ජාතික ලුණු සමාගම

## කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ වන ජාතික ලුණු සමාගම රජය සතු සමාගමකි. කොළඹ ප්‍රධාන කාර්යාලයෙහි සහ අලිමංකඩ (කිලිනොච්චි) ලුණු ලේවායෙහි සේවය කිරීම සඳහා පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරු - මුදල් - (MM1-1)

**ස්ථිර පදනම මත (තනතුරු 01 යි - කොළඹ ප්‍රධාන කාර්යාලය)**

**අවශ්‍යය සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් කළමනාකරණ හෝ වාණිජ උපාධියක් සහ ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු ඕනෑම රජයේ හෝ පිළිගත් ආයතනයක මූල්‍ය කළමනාකරු හෝ ගණකාධිකාරී ලෙස අවම එක් (01) වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**හෝ**

2. ICAL, CIMA අතරමැදි මට්ටම සමත්වීම සමග ඕනෑම රජයේ ආයතනයක හෝ ඕනෑම පිළිගත් ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ අවම එක් (01) වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

1. බාහිර අයදුම්කරුවන් සඳහා වන ඉහත සුදුසුකම් ලබාතිබීම.

**හෝ**

2. තනතුරට අදාළ පරාසයේ, කනිෂ්ඨ කළමනාකරු (JM) වර්ගීකරණයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය :** MM1-1-2016 - (මූලික වැටුප - රු. 53,175- වර්ධක - 10X1,375 - 15X1,910-95,575) සහ ජීවන අංක දීමනාව රු. 17,800/= විශේෂ දීමනා රු. 5,000/= වෘත්තිය දීමනාව රු. 3,000/= දුරකථන දීමනාව රු. 2,000/= සහ අනෙකුත් රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ පරිපාටිය :** ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් හරහා.

## යන්ත්‍රාගාර කළමනාකරු

**කොන්ත්‍රාත් පදනම මත එක් වසරක කාලයක් සඳහා (තනතුරු 01 යි - අලිමංකඩ ලුණු ලේවාය)**

නිදහස් ප්‍රවාහ ලුණු කුඩු කිරීමේ යන්ත්‍රාගාර කළමනාකරු ලෙස ඔහු/ ඇය යන්ත්‍රාගාරයේ සමස්ත ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීමේ සහ නිෂ්පාදන ඉලක්ක සපුරා ඇති බව සහතික කිරීම සහ ආරක්ෂිත සහ කාර්යක්ෂම සේවා පරිසරයක් සහතික කිරීම සඳහා කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීමේ වගකීම දරයි.

**අවශ්‍ය සුදුසුකම් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් භෞතික විද්‍යා හෝ ඉංජිනේරු (යාන්ත්‍රික) උපාධියක් සහ ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු ඕනෑම රජයේ හෝ පිළිගත් කාර්මික ආයතනයක අවම එක් (01) වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**හෝ**

2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද යාන්ත්‍රික / මෝටර් රථ/ අදාළ ක්ෂේත්‍රයක, ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම - 7 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම සහ කාර්මික ආයතනයක හෝ අදාළ ව්‍යාපෘතියක අවම එක් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**වේතනය :**

**මූලික වැටුප :** රු. 53,175 සහ රජයේ අනුමත වෙනත් දීමනා, (ජීවන අංක දීමනාව රු. 17,800/= මාසික දීමනාව : රු. 5,000/= දුරකථන දීමනාව : රු. 2,000/= සහ වෘත්තීය දීමනාව : රු. 3,000/=)

**වයස් සීමාව**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීමේ පරිපාටිය**

ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් හරහා

**වෙනත්**

**සෑම අයදුම්කරුවෙක්ම**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුයි.

ii. තනතුරෙහි රාජකාරී මනාව ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය තත්ත්වයේ සිටිය යුතු අතර දිවයිනේ ඕනෑම පළාතක සේවය කළ හැකි විය යුතුය.

iii. විශිෂ්ට චරිතයක් සහිත විය යුතුය.

ඔබගේ අයදුම්පත්, සහතික පිටපත් සමග පහත ලිපිනය වෙත 2024.12.09 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සාමාන්‍යාධිකාරී**
**ජාතික ලුණු සමාගම,**
**අංක 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05.**
**011-2368974**

කවරයෙහි වම් කෙලවරෙහි තනතුරු නාමය සඳහන් කළ යුතුය. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.